# මරණය, ශෝකය සහ සිංහල හැඬීම



මරණයක් සිදුවූ කල පවුලේ සාමාජිකයින්, කිට්ටුම නෑදෑයින් සහ හිතවතුන් හඬා වැළපීම සහ ශෝකවීම කවුරුත් අත්දැක ඇති සුපුරුදු දෙයකි. මේ ලිපියෙන් මා අදහස් කරන්නේ ශ්‍රීලාංකික මරණයකදී, විශේෂයෙන් සිංහළ අයගේ මරණයකදී දකින්නට ලැබෙන දේ පැහැදිලි කිරීමට ය.

ලංකාවේ ගම් පළාතක මරණයක් සිදුවූ කල්හි මරණයේ කටයුතු අවසන් කිරීමට අඩුම ගණනේ සතියක්වත් අවශ්‍ය වේ. ඈත සිටින නෑදෑයින්ට කියා යැවිය යුතු ය. හැමෝටම ටෙලිපෝන් නැති නිසා ටෙලිග්‍රෑම් යැවීමෙන් හෝ බස්ගාස්තු දී පණිවුඩකරුවෙකු යැවීමෙන් ඒ කාර්යය කෙරේ. පවුලේ සාමාජිකයින්, එනම් පුතුන් හෝ දියණියන් පිටරට සිටිනවා නම් ඒ අයට දන්වා යවා සමහර විට ඔවුන් එනතුරු අවසන් කටයුතු ප්‍රමාද කරන අවස්ථාද බොහෝ ය.

මේ අතරතුර ගමේ අසල්වාසීහු ද මළගෙදරට එකතුව අවමඟුලේ වැඩ කටයුතු ලෑස්තිකරති. ගේ ඉදිරිපිට ලොකු මඩුවක් හෝ කූඩාරමක් විගසින් තැනේ. ඊට අවශ්‍ය පුටු හා රෙදි අසල්වාසී ගෙවල් වලින් එකතු කෙරේ. දැන්නම් ඒවා කුලියට සපයන ස්ථාන බොහෝය. මෘත දේහයට අවසන් ගෞරව දක්වන්නට එන අයට සංග්‍රහකරන්නට සිසිල්බීම, බුලත්විට ආදිය ද සම්පාදනය කිරීමට එකිනෙකා බාර ගනිති. වළකැපීම හෝ දරසෑය බැඳීම, ගොක්කොළ ඇදීම, තොරණක් ගැහීම හා පාවඩ දැමීමද ආදියද හිතවතුන්ගේ ආධාරයෙන් කෙරේ. මරණ කටයුතු අවසන් වනතුරා මරණෙ ගෙදර පාළුවට නොතැබීමට අසල්වාසීහුද ගෙදර අය සමග නිදිමරති. එළියේ කාඩ් සෙල්ලම් කරති. කොළඹ ඇතැම් ගෙවල්වල රෑට වෙස්සන්තර ජාතක කවි ද ගායනා කරති. අපේ ජනතාවගේ සැබෑ එකමුතු කම මෙයින් ප්‍රදර්ශනය වේ.

ලංකාවේ මරණ ගෙදරක විශේෂ තැනක් ගන්නේ ඇඬිල්ල හෙවත් ශෝකවීමයි. එම ඇඬීමේද එක් එක් විධි හා ප්‍රමාණ ඇත. හීන් හඬින් ඉකිගසා ඇඬීමේ සිට, මර ලතෝනි දී කෑගැසීම දක්වා එය වර්ග කළ හැකිය. සමහරු පපුවට ගහ ගනිති. මිනී පෙට්ටිය බදා ගනිති. ඔවුන් ඉවත් කිරීමට කීප දෙනෙකු මහන්සි ගත යුතුය. මිනිය වළලන අවස්ථාවේ වළට පනින්නට යන අය මම දැක ඇත්තෙමි. මේ තත්වයට පත් වන්නේ වැඩිපුරම ගැහැණු උදවියයි. එසේ හැඬීමෙන් දුක නොපෙන්නුවහොත් මැරුණු කෙනා ජීවත්ව ඉන්දෙද්දී සැලකුවේ නැතැයි පිට අය වැරදියට හිතනවා ඇතැයි බොහෝ විට ඒ අඬන අයගේ කල්පනාවයි. එක්කෙනෙකුගේ ඇඬීම තුනී වී යන විට තවකෙනෙක් පටන් ගනී. දුර බැහැර සිට එන පවුලේ ඥාතිවරයෙකු ගෙට ඇතුල්වන්නේ බොහෝ විට අඬාගෙන ය. එවිට ඇඬිල්ල නවතා සිටි අය නැවත මහ හඬින් විලාප තියති.

ශ්‍රීලංකාවේ දී මෙසේ වුවද ශ්‍රීලාංකිකයින් වෙසෙන මේ එංගලන්තයේ අප මේ කාලය ඇතුළත සිය ගණනක් ලාංකික අවමංගලයන්ට සහභාගීවී ඇත. යාන්තමට ඇස්වල කඳුළු පුරවා ශෝක වෙනවා හැරෙන්නට ඉහතින් දැක්වූ ආකාරයේ කෑගසා හැඬිල්ලක් මෙහි වෙසෙන සිංහලයින් තුළ නැත. එයට හේතුව ඔවුන් මෙහි සමාජ සිරිත් විරිත්වලට අනුගත වී සිටින බැවිනි.

එහෙත් ලන්ඩනයේ දී දැනට අවුරුදු 29 කට පෙර දක්නට ලැබුණු එක් විශේෂ අවස්ථාවක් මට මෙහිදී සිහිපත් වේ. එය මෙසේ ය.

මෙය වූයේ 1979 වසරේදී ය. එවකට ලන්ඩනයේ නීතිඥයෙකු ලෙස කටයුතු කළ අප හිතවත් නාමෙල් වීරමුණි කලාකරුවාණන්ගේ සමීප මිතුරෙකු ලංකාවේදී අසාධ්‍ය රෝගයක් වැළදී වැඩිදුර ප්‍රතිකාර සඳහා ලන්ඩනයට ගෙනැවිත් තිබුණි. සති දෙකකට පසුව ඔහු රෝහලේ දී මියගියේය. මිනිය ලංකාවට නොයවා අවසන් කටයුතු ලන්ඩනයේම සිදුකරන්නට තීරණය වී මියගිය යහළුවාගේ බිරිඳ හා කුඩා පුතාද ලංකාවේ සිට ලන්ඩනයට එන බව නාමෙල් අපට කීවේ ය.

බටහිර ලන්ඩනයේ ගෝල්ඩර්ස් ග්‍රීන් සුසාන භූමිය වෙත ගෙන යන්නට කලින් Kilburn High Road හි දැනට ඇති අයිස්ලන්ඩ් සමාගමට යාබද Crooks Brothers' Funeral Parlour නම් අවමංගල්‍ය ශාලාවේ දේහය තැන්පත්කර තිබුණි.

උදේම පැමිණ සිටි අප ලාංකික පිරිස එම සාප්පුව අරින උදේ 9 වන තුරු අවට රැඳී සිටියෙමු. මියගිය අයගේ බිරිඳ සහ පුතා අප ළඟම සිටියෝය. ඔවුන් ලංකාවේ සිට එදා උදෑසන ලන්ඩනයට පැමිණ තිබුණි. පැරණි ලන්ඩන් විහාරයෙන් වැඩම කර සිටි ස්වාමීන් වහන්සේලා දෙනමක් ද වූහ.

සාප්පුවේ දොරවල් විවෘත කළ එහි බාරකාර සුද්දෝ දෙදෙන මිනිය බලන්නට එන ලෙස පිරිස ඇතුළට කැඳවූහ. එකෙණෙහිම ශ්‍රී ලංකාවෙන් පැමිණ සිටි මියගිය අයගේ බිරිඳ “ මගේ බුදු වස්තුවේ.... අනේ මං කොහොම ඉවසන්නදෝ...” යනුවෙන් ලන්ඩනය දෙවනත් වන තරමේ හඬින් මහා විලාපයක් නැගීය. ඒ හඬ මහපාරට විහිදී ගියෙන් පාරේ යන අයද එතැනට දුවගෙන ආහ. හනිහනික සුද්දෝ ලාංකික පිරිස ඇතුළට ගෙන දොර ජනෙල් වසා දැමූහ. ඔවුන් එවැනි මර ලතෝනියක් ඉන්පෙර අසන්නට නැතුවා ඇත.

ඒදින සවස මම නාමෙල්ගේ නිවසට ගියෙමි. නාමෙල්ගේ බිරිඳ මාලිනී හා දරුවන් සමග මහා හඬින් හිනාවෙමින්, විහිළු තහළු කරමින් එහි සිටියේ අර උදේ විලාප තැබූ භාර්යාවය. ඒදින උදේ ඇය කළ ඒ ගිරිය යටින් කෑගැහිල්ල කොතරම් ප්‍රෝඩා මවාපෑමක්දැයි මට ඒ මොහොතේ ක්ෂණිකව සිතට නැගිණ.

ලෝකයේ වෙනත් කිසිම රටක ගැහැණුන් මිනිසුන් ලංකාවේ සිංහළයින් මෙන් මරණයකදී වියරුවෙන් කෑගහන බවක් මම මෙතුවක් අසා නැත. එය යුරෝපයේ පවතින විනය, සංවරකම සහ හැඟීම් ආවේග පාලනය කරගැන්මේ හැකියාව මත සිදුවන බව සිතාගත හැක. එහෙත් අප රටේ බහුතරයක් බෞද්ධාගමිකයින් වුවද, බුදුදහමේ උගන්වන අනිත්‍ය දහම හා ඇඬීමේ ඇති නිසරුකම ලංකාවේ අපේ සිංහල ජනතාවගේ සිත්තුළට කාවැදී නැතිවීම මෙම වෙනසට හේතුව යයි සිතමි. එසේම සිංහලයින්ගේ ඒ විකාර ඇඬීම ශෝකය නිසා මතුවී එන දෙයක් නොව තනිකරම බලා සිටින අයට පෙනෙන්නට කරන දක්ෂ රඟපෑමක් බව ද මම දැන් පැහැදිලිව වටහාගෙන සිටිමි..

♦ **විල්ප්‍රඩ් පෙරේරා** Berkshire UK

# ජාතිය විහින් අමාරුවේ වැටීම

වව්නියාවේ සිට කැබිතිගොල්ලෑව දක්වා යන මාර්ගයේ 4 කනුව ළඟින් වමට හැරී පිරප්පම්මඩු මාර්ගයේ කි.මී 2 ක් පමණ දුර ගිය තැන හමුවන හන්දියෙන් දකුණට හැරී මීටර් කිහිපයක් ගියතැන වැලිකන්ද නමින් විශාල ගලක් හමුවෙයි. මෙම ගල කැඩීමේ ව්‍යාපාරයක් කලක් සිටම සිදුවෙයි. අපට ඇති ගැටළුව එය නොව, මෙම ප්‍රදේශය තුළ ත්‍රස්තවාදීන් ගැවසෙන, ඔවුන්ට නිදහස ඇති ප්‍රදේශයක් වීමත්, ඉහත ගල්වලේ සේවකයින් ද්‍රවිඩ අය වීමත් ය.

පසුගිය දිනක මෙය ආසන්නයේ අඩි 25 ක් පමණ ගැඹුරට හාරා ( මණියර් කුලම වැව ඉස්මත්තේ ) නිදන් හොරු, නිධානයක් ගත් බව අපි දැන්වූවෙමු. ඊට පසු දිනක පිරප්පන් මඩු මාර්ගයට හැරෙන වංගුවේ ඇති ප්‍රධාන මාර්ගයට වම්පසින් ඇති පොලිස් මුර පොළට ත්‍රස්තවාදීහු පහර දුන්හ. ඊටත් පසුව පොලිස් මුරපොළ ආසන්නයේම ප්‍රධාන මාර්ගයේ 3 කනුව ළඟ ත්‍රස්තවාදීහු ක්ලේමෝ බෝම්බයක් පිපිරවූහ. තවමත් මෙම ප්‍රදේශයේ ත්‍රස්තවාදීන් නිතර ගැවසෙන බව ගම්වාසීහු කියති.

මෙවන් පරිසරයක කිසිදු පරීක්ෂාවකින් තොරව කටයුතු කිරීමේ හා ජාතියට ඇති අවදානම ගැන නොසලකා කටයුතු කිරීමේ විපාක අප පසුගිය දින ( 2008-01-14 ) විඳගත්තෙමු. එනම් ඉහත ගල්කඩන ගල පිපිරවීම සඳහා යුධ හමුදාව එහි ඇති අනාරක්ෂිත බව ගැන නොසලකමින් කිසිම පරීක්ෂාවකින් තොරව ගොස් මහත් විපතකට පත්වීම යි. මෙම ගල පිපිරවීමට පුපුරනද්‍රව්‍ය රැගෙන ගිය යුධ හමුදාවේ අය ගමන් ගත් ( සිවිල් ) වෑන් එක එම ගල ආසන්නයේම ඇති වන්ගුවේ දී ක්ලේමෝ බෝම්බයක් මඟින් පුපුරුවා හැරීම යි. පසුව වෙඩි තැබීමක් ද සිදුකොට ඇත.

මෙයින් සිවිල් ආරක්ෂක බලකායේ, නන්දිමිත්‍ර බලකායේ, යුධ හමුදාවේ ඉන්ජිනේරු බලකායේ, භටයන් කීපදෙනෙක් එතැනම මරණයට පත්වූ අතර තවත් සිවිල් අයෙක් හා යුධ හමුදාවේ අයෙක් දැඩි තුවාල ලැබූහ.

මෙම සිදුවීම ගැන සටහන් කළේ මෙය තවත් සිදුවීමක් ලෙස කියවා ඔබට පසෙක දැමීමට නොවේ. ජාතියට රණ විරුවන් අතිශයින්ම උවමනා මෙවන් අවධියක කිහිප දෙකනුගේ උවමනාවන් සඳහා එවන් අනාරක්ෂිත කැලෑවකට ( ජනාකීර්ණ කොළඹ නගරය පුරාම ක්ලේමෝ පුපුරන සමයක ) මෙසේ හමුදා කණ්ඩායම් යවන්නේ ඇයි? කාගේ උවමනාවටද?

මෙම ප්‍රදේශයේ පවතින තත්ත්වය අනුව එහි ඇති වෙඩිතිබ්බවැව කුඹුරු කිරීමටවත් , කැලේට කෝටුවක් හෝ දරලීයක් සඳහාවත් සාමාන්‍ය වැසියකුටවත් යාමට අවකාශයක් නැති අවස්ථාවක, ඔවුන් පවා එම ප්‍රදේශයට යාම අනතුරු දායකබව දැන තිබියදීත් මෙසේ යුධ හමුදාව රැගත් විශාල ලෙස පුපුරණ ද්‍රව්‍ය පටවාගත් සිවිල් වෑන් එකක් මෙහි යැවීමට තරම් යුධ හමුදාවේ හා ආරක්ෂක අංශවල බලවත්තු මෙතරම් මෝඩද යන්න ප්‍රශ්න කරමි.

මෙම ගල කැඩීමේ කම්කරුවන් ද්‍රවිඩ අය වීම ද මෙම සිදුවීම හා ඔවුන්ගේ ද යම් දායකත්වයක් ඇතැයි ප්‍රදේශවාසීන් අතර සැකයක් ඇතිකරවා ඇත. එය එසේ වුවත් අපට මෙහිදී ද ඇඟිල්ල දිගුකිරීමට වන්නේ 14 - 15 තරම් දෙමළ කම්කරුවන් පිරිසක් සේවය කරන කැලෑවක ඇති මෙවන් තැනකට කිසිදු පරීක්ෂාවකින් තොරව පුපුරන ද්‍රව්‍ය හා යුධ හමුදාව රැගෙන යන්නන් හා යවන්නන් පිළිබඳව ඇතිවන්නේ කළකිරීමකි. තරහකි. ඔවුන් මෙම විනාසයට වගකිවයුතු බව එම මොහොතේ එතැනට රැස්වූ පිරිස එකළෙහළාම කියමින් බැන වැදුණෝය. “ මෙම ප්‍රදේශයේ කොටි ගැවසෙන බව අපි කිව්වත් එය කවුරුවත් සැලකුවේ නැහැ ” ඒ පිරිස කීහ. මෙහි සේවකයින් මෙයට සම්බන්ධ යැයි ද, මෙහි අයිතිකරුවන් හා ඊට උදව්කරන අය ද මේවාට වගකියයුතු බව ද ඔවුන්ගෙන් කියැවිණ.

කෙසේ හෝ මහත් විනාශයක් සිදුවිය. ඔබ කළයුත්තේ ජාතියේ බලධරයන්ගේ නෙත් මෙවන් නොසැලකිල්ලෙන් කටයුතු කිරීමෙන් සිදුවන කනගාටු දායක දෙයින් වලකා ගන්නට දැඩි පියවර ගැනීමට පෙළඹවීමයි.

අවසන් වශයෙන් එම මොහොතේ එම ස්ථානයට රැස්වූ ( වෙඩිහඬ ඇසෙද්දී ) සාමාන්‍ය වැසියන්, පොලිස් හා හමුදා නිලධාරීන් මෙන්ම, සිවිල් ආරක්ෂක බලකායේ සැමටත්, රෝගීන් ගෙනයාමට කටයුතු කළ අයටත් ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුයැයි පවසනු කැමැත්තෙමි. එසේම රෝගීව සිටින රණ විරුවන්ට නීරෝගී සුවය ද, මියගිය විරුවන්ට නිවන් සුවය ද ප්‍රර්ථනා කරමි.

මෙවන් නිරපරාදේ ජාතිය මිහිදන් වන වැඩකරන මහලොක්කන් සහ සම්මාදන්කරුවන් මුළු ජාතියේම අප්‍රසාදය ට හා පිළිකුලට පාත්‍ර විය යුතු ය.

♦ **පූජ්‍ය කුරුඳුගොඩ ප්‍රඥාසාර හිමි - වව්නියාව**

